876

# ග්‍රාමීය කර්මාන්තයන්ගේ කාර්යසාධනය විෂයෙහි අන්තර් පුද්ගල සම්බන්ධතාවන්ගේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
23 APR 2014
UNIVERSITY OF KELANIYA

ඩී. ජී. ජී. එස්. දයානාත්

කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාපති උපාධිය සඳහා වන පාර්ශවීය අවශ්‍යතාවක් ලෙස මෙම පර්යේෂණ නිබන්ධනය සම්පූර්ණ කරනු ලැබීය.



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 876 |
| වර්ග අංකය: | |



ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය

කැළණිය විශ්ව විද්‍යාලය

2011 ජුනි

# සාරාංශය

ග්‍රාමීය හා කුඩා කර්මාන්ත අංශයේ ප්‍රවර්ධනය සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දීර්ඝ කාලයක් අඛණ්ඩව සම්ප්‍රදායික සැපයුම් සාදක යොමුකිරීමට කටයුතු කර ඇත.නමුත් පුළුල්ව පිළිගත් ජාතික වෘද්ධි අරමුණක් ලෙස ග්‍රාමීය කර්මාන්තවල කාර්යසාධනය ඉහළ නොයාම ඔස්සේ සාර්ව ආර්ථික කළමණාකරණය තුල ග්‍රාමීය අංශයේ සාපේක්ෂ දායකත්වය නොලැබීමේ ගැටළුවක් පවතී. ඊට සමගාමීව ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඇතිකරගෙන ඇති අරමුණු හා ඉලක්ක සපුරාගැනීමට අසමත්වීම තුල ඉදිරි ප්‍රතිපත්තිමය හා උපායමාර්ගික ප්‍රවේශයන් කෙසේ විය යුතුද යන්න පිළිබඳ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයේ ගැටළුවක් මතුව ඇත. එසේ හෙයින් ග්‍රාමීය කර්මාන්තවල කාර්යසාධනයේදී සම්ප්‍රදායික සැපයුම් සාදක වලින් ඔබ්බට ගොස් ව්‍යාපාරික වශයෙන් වැදගත් උපායමාර්ගයක් ලෙස අන්තර් පුද්ගල සම්බන්ධතා සැලකිල්ලට ගැනීමට මෙම පර්යේෂණ යොමුකර ඇත. ඒ අනුව ග්‍රාමීය කර්මාන්තවල කාර්යසාධනය මත අන්තර් පුද්ගල සම්බන්ධතාවල බලපෑමක් පවතීද යන්න හා ව්‍යාපාරික සාර්ථකත්වය සඳහා අන්තර් පුද්ගල සම්බන්ධතා ග්‍රාමීය ව්‍යවසායයන් විසින් භාවිතා කරන ආකාරය පරික්ෂාවට ලක්කර ඇත. ඒ සඳහා ග්‍රාමීය කර්මාන්තවල කාර්යසාධනය සමඟ විධිමත් / අවිධිමත් අන්තර් පුද්ගල සම්බන්ධතාවල ප්‍රමාණය හා ව්‍යාප්තිය මෙන්ම එම සම්බන්ධතා ඔස්සේ ඇතිවන සැපයුම් උත්තේජක අන්‍යෝන්‍ය වශයෙන් ස්වායක්තද යන්න පරික්ෂා කරයි. පොළොන්නරු දිස්ත්‍රික්කයේ ග්‍රාමීය කර්මාන්ත සමුපකාර සමිති සාමාජිකයින් වෙත ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ලබාදෙමින් ලබාගත් දත්ත යොදාගනිමින් සිද්ධි අධ්‍යයන පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ මෙම අධ්‍යයනය සිදුකර ඇත. එහිදී කයි(ස්)ක්ව්‍යා පරික්ෂාව තුලින් පර්යේෂණ උපන්‍යාසයන්ට අදාල විචල්‍යයන්ගේ ස්වායක්තතාවද, ආගණිත හව්‍යතා සංගුණකය මඟින් විචල්‍ය දෙකෙහි අන්‍යෝන්‍ය රූඪියාවේ මට්ටමද තක්සේරු කර ඇත. ඒ අනුව ග්‍රාමීය ව්‍යවසායයන්ගේ කාර්යසාධනය හා අන්තර් පුද්ගල සම්බන්ධතා අන්‍යෝන්‍ය වශයෙන් ස්වායක්ත නොවන බවත් ව්‍යාපාරික උපදෙස් හා තොරතුරු ලබාගැනීම, කුසලතා සංවර්ධනය, මූල්‍ය උපකාර ලබාගැනීම, අමුද්‍රව්‍ය ලබාගැනීම, තාක්ෂණය ලබාගැනීම, වෙළඳපල අවස්ථා ලබාගැනීම, ආදිය සඳහා මෙම අන්තර් සම්බන්ධතා භාවිතා කරන බවත් තහවුරු විය. එනිසා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනයේදී, සම්ප්‍රදායිකව ඍජු ආධාර සැපයීමේ ප්‍රතිපත්තිමය ප්‍රවේශයෙන් ඔබ්බට ගොස් අන්තර් පුද්ගල සම්බන්ධතා පාදක සංවර්ධන උපාය මාර්ගයක් වෙත යොමුවීමට නිර්දේශ කරයි.



**මූලික පද - ග්‍රාමීය කර්මාන්ත, අන්තර් පුද්ගල සම්බන්ධතා, ව්‍යාපාරික කාර්යසාධනය, කුඩා කර්මාන්ත**